# අඹන්පොළ අතරගල්ල-ගුරුගොඩ පුරාවිද්‍යා භූමියෙන් හමු වූ වහරල ශිලාලේඛන පිළිබඳ අධ්‍යයනයක

**කැලේගම ජිනරතන හිමි[1], කරුණාසේන හෙට්ටිආරච්චි[2], ටී. ඩී. සී. පුෂ්පකුමාර[3], ඩී.එම්.එම්.නිරෝෂන්[4]**

[1]පර්යේෂණ නිලධාරී, මධ්‍යමසංස්කෘතික අරමුදල, jkelegama@yahoo.com
[2] මහාචාර්ය, ඉතිහාස හා පුරාවිද්‍යාඅධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,නුගේගොඩ
[3],[4] පර්යේෂණ නිලධාරී, මධ්‍යම සංස්කෘතික අරමුදල

## හැඳින්වීම

වයඹ පලාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අඹන්පොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි අතරගල්ල ග්‍රාමසේවා වසමට ඇතුළත් වන අතරගල්ල-ගුරුගොඩ ග්‍රාමයෙහි මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ ක්‍රියාත්මක වයඹ සංස්කෘතික චතුරස්‍රයට අයත් යාපහුව ව්‍යාපෘතිය මගින් සිදුකරන ලද කැනීම් හා ගවේෂණවල දී මෑත දී හමුවුණු ශිලාලේඛනයක් පිළිබඳ ව විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ. හඳුනා ගැනීමට අනුව ක්‍රි.ව. 4-7 සියවස් අතරට අයත්වන මෙම ශිලාලේඛනය එම පුරාවිද්‍යා භූමියෙහි පිහිටි ගල් තලාවක සටහන් කොට ඇත. අන්තර්ගතය අනුව එය *වහරල* සෙල්ලිපියක් බව සොයාගත හැකි වූ බැවින් ඒ පිළිබඳවත් අතරගල්ල ගුරුගොඩ පුරාවිද්‍යා භූමිය හඳුනාගැනීමට මෙම සෙල්ලිපියෙන් ලැබෙන දායකත්වය විමසා බැලීමත් මෙම ලිපියෙහි අරමුණ වේ.

## ක්‍රමවේදය

මේ සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය ප්‍රධාන වන හෙයින් අතරගල්ල - ගුරුගොඩ පුරාවිද්‍යා භූමියෙහි ඇති පර්වත ලිපිය පිටපත් කොට කියවා අර්ථ නිරූපණය කිරීම මූලික ක්‍රමවේදයයි. මේ හැර සෙල්ලිපියෙන් කියවෙන තොරතුරු සාහිත්‍ය මූලාශ්‍ර හා වෙනත් ශිලාලේඛන ආශ්‍රයෙන් සනාථ කර ගැනීමට ද උත්සාහ කෙරේ.

## අන්තර්ගතය හා පර්යේෂණ ප්‍රතිඵල

අතරගල්ල - ගුරුගොඩ ශිලාලේඛනය අනාවරණය වූයේ මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් වයඹ සංස්කෘතික චතුරස්‍රය යටතේ අතරගල්ල - ගුරුගොඩ පුරාවිද්‍යා භූමියේ කැනීම් ආරම්භ කිරීමෙන් පසු සිදුකරන ලද ගවේෂණයන්හි දී ය. එය 2013.09.05 දින හමුවුණි. මෙම පුරාවිද්‍යා භූමිය පිහිටා තිබෙන්නේ හාත්පස තැනිතලා භූමියෙන් මදක් උස් වූ ගල්තලාවකින් යුතු භූමියක ය. එම භූමියට ගිණිකොන දිසාවෙන් ඉතා නුදුරින් ඓ නම් මීටර් 200ක පමණ දුරින් මී ඔය ගලා බසී. වියළි කලාපයට අයත් මෙම භූමි ප්‍රදේශය වඩා සශ්‍රීක කරනුයේ මී ඔයේ ජලයෙනි. මේ හැර මෙම පුරාවිද්‍යා භූමිය පිහිටි හාත්පස ප්‍රදේශයේ මීටර් 500ක් පමණ නිරිත දිශාවෙන් අබකොළ වැව පිහිටා ඇති අතර ඊට උතුරින් කිලෝ මීටර් 1.5ක් පමණ දුරින් අතරගල්ල වැව පිහිටා ඇත. දැනට මෙය රජය විසින් ජලාශයක් බවට පත්කොට ඇත. මේ හැර තදාසන්න ප්‍රදේශයේ මී ඔයෙන් ජලය ලබා ගනිමින් පෝෂණය වන මැඩියාව වැව ද වන්නේ ය. මෙම ප්‍රධාන වැව් 3ට අමතර ව කුඩාවැව් ගණනාවක් ආශ්‍රිත කලාපයේ අතීතයේ දී පැවති බවට සාධක වේ. මේ අනුව අතරගල්ල ප්‍රදේශය තුළ මානව ජනාවාසවලට සුදුසු පරිසරයක් අතීතයේ සිට ගොඩනැගී පැවති බව පැහැදිළි වේ. දැනට මෙම ආරාම භූමිය අක්කර 1.5කට පමණ සීමා වී පවත්නා අතර මෙහි දාගැබ, පිළිමගෙය, ගල්කණු සහිත ගොඩනැගිලි කිහිපයක සාධක වේ. මේ සියල්ල ම නිදන හොරුන්ගේ ග්‍රහණයට හසු වී දැඩි ලෙස විනාශ ව පවතී. දාගැබ පිහිටා ඇත්තේ ආරාම භූමියේ උසම ගොඩැල්ලෙහි ය. අතීතයේ දී එම දාගැබ මුළු ප්‍රදේශයට ම හොඳින් දර්ශනය වන්නට ඇත.

අපගේ අධ්‍යයනයට ලක්වන සෙල්ලිපිය පිහිටා ඇත්තේ පුරාවිද්‍යා භූමියේ නටබුන් දාගැබට නැගෙනහිර දිශාවෙනි. මෙය පිහිටි ගලේ මීද බෑවුම් සහිත ස්ථානයක පිහිටුවා ඇත. අක්‍ෂර පේළි හතරකින් යුතු මෙම සෙල්ලිපියේ බොහෝ කොටස් පතුරු ගැළ වී විනාශ ව ඇත. එ බැවින් සෙල්ලිපියෙහි පූර්ණ අර්ථයක් ගත නොහැකි තත්වයක් උදා වී ඇත. සෙල්ලිපිය පර්වතයේ සෙ.මී. 180ක් පමණ ප්‍රදේශයේ විහිද පවතී. එහි පළල සෙ.මී. 40 ක් පමණ වේ. දළ වශයෙන් අක්‍ෂරයක ප්‍රමාණය සෙ.මී. 5ක් පමණ වේ. මෙහි අක්‍ෂර ලක්‍ෂණවලට අනුව ශිලාලේඛනය ක්‍රි.ව. 5 වන සියවසට පමණ අයත් වේ. මෙහි එක ම ස්ථානයේ සෙල්ලිපි 3ක් පිහිටුවා ඇති බව හඳුනාගත හැකි ය. එ සේ වුවත් වඩාත් හොඳින් කියවා අර්ථ ගත හැක්කේ එක් සෙල්ලිපියක පමණි.

### අංක 1 ලිපිය

මෙම සෙල්ලිපිය තනි පෙළක් වශයෙන් පමණක් ලියැ වී ඇති බව සිතිය හැකි අතර අවසන් පද කීපය පමණක් හිඳුනාගත හැකි ය.

පෙළ : *ම(නි)........යන විදි වහරල*

අර්ථ : ..........යන් වහරල මුදවන ලදී

### අංක 2 ලිපිය

මෙම ශිලාලේඛනය අංක 1 ලිපියට පහලින් දෙපෙළක් වශයෙන් ලියා ඇත. මේවා එකිනෙක වෙන්කොට හිදුනා ගැනීමට ද දුෂ්කර වේ. පළමු පෙළ සැලකිය යුතු තරම් ආරක්ෂා වී ඇතත් දෙවන පෙළ අපහැදිළි ය. මෙහි ඇති වැදගත් ම කරුණ වන්නේ සෙල්ලිපිය පිහිටි එම නටබුන් විහාරයෙහි පැරණි නාමය සිඳහන් ව තිබීමයි.

පෙළ : *අතරගල වි(හ)රෙ වඩු මිහිදලහ වරිල*

*........(ත)..........රිල*

අර්ථ : අතරගල විහාරයෙහි වඩු මිහිදල ගේ වහරල ....................

### අංක 3 ලිපිය

මෙම ලිපිය අංක 2 සෙල්ලිපියේ අක්ෂර පෙළට දකුණු පසින් ඊට සමගාමීව දෙපෙළක් වශයෙන් පිහිටුවා ඇත. අක්ෂර හොඳින් ආරක්ෂා වී ඇත.

පෙළ : ***කසුපය සයලම***

***ලය විද වහරල***

අර්ථ : කාෂ්‍යප (විසින්) ස්වකීය බාල මල්ලී වහරල මුදවන ලදී

### විවරණ

**විදි වහරල** : මෙම යෙදුම අංක 1 හා 3 සෙල්ලිපි දෙ කෙහි ම යෙදි ඇතත් අංක 3 ලිපියෙහි **විදි** යන පදය වෙනුවට යෙදී ඇත්තේ **විද** යනුවෙනි. මීට අමතර ව අංක 2 ලිපියෙහි විදි හෝ විද යන පදය නොමැති ව **වරිල** යනුවෙන් පමණක් යෙදී තිබේ. මෙම **වරිල** යන්න ද **වහරල** යන්නෙහි ම තවත් රූපයක් විය යුතු ය. දැනට වෙනත් ස්ථානවලින් හමු වී ඇති ඇතැම් ලිපිවල විදි යන පදය වහරල යන්නට පරව ද යෙදී ඇත. මෙම පදය **වදව, වදවි, විදව, වදෙව, විදෙව, සිදැව, සිදෙව, සදෙව, සදව, සද** රූපවලින් ද වහරල යන පදය **විහරල, වෙහෙරල, වෙහෙරිල, විහරිල, වහරලය, විහරලය, වෙහෙරලය, හෙරිලය, විහරිලය** යන රූප වලින් ද යෙදී ඇත (ප්‍රියංක 2012:11). මෙම වචනවලින් කියැවෙන සංසිද්ධිය පිළිබඳ ව උගතුන් අතර ඒකමතිකතාවක් නොමැත. ඒ සිදහා විවිධ මත ඉදිරිපත් ව තිබේ.

මේ වචනය සඳහා පලමුවෙන් ම අර්ථ ඉදිරිපත් කරන්නේ 1896 දී එච්.සී.පී. බෙල් විසිනි. ඔහු කහටගස්දිගිලියට නුදුරු කොටකන්ද ඇත්කිඳ විහාරයේ ඇති ලිපියක එන **වහෙරිල විදි**......." යන්නට **විහාර** යනුවෙන් අර්ථ දෙයි (Bell 1896:54). මෙයින් පසුව උගතුන් විසින් පහත මත වරින් වර ඉදිරිපත් කර ඇත. පරණවිතාන විසින් **විදවි** යන්න සංස්කෘත **විද්** යන්නෙන් **ලද** ධාතුවේ අතීත කාල ප්‍රථම පුරුෂ ඒක වචන ත්‍රෛකාලික ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් ලෙස ගෙන ඇත. එය පාලි **වින්දාපයී** යන්නට හා නූතන සිංහල **සීදවි** යන්නට සමාන බව සිදහන කරයි (Paranavitana 1943:131). **වහරල** යන පදය සංස්කෘත **වෘෂල** (පාළිඃ වසල) පදයෙන් වරසල>වරහල>වහල් යනුවෙන් බිඳී එන්නට ඇතැයි සිදහන් කරයි. මේ අනුව වහල් මෙහෙයෙහි යෙදී සිටි වහලුන් මුදල්



ඡායාරූපය 01

ගෙවා වහල් බවින් නිදහස්වීම මින් අදහස්වන බව පෙන්වා දෙයි (ibid:134). වල්පොල රාහුල හිමියන් ද පරණවිතානයන්ගේ එම මතය පිළිගනී (රාහුල හිමි 1995:52-53). ඩී. ජේ. විජේරත්න දර හෝ දැව කැප්පවීම මින් අදහස් කරන බව කියයි (Wijayaratna 1952:103). මැදඋයන්ගොඩ විමලකිත්ති හිමියෝ විහාර සළාකය මුදවන ලදී යන අදහස ඇති බව සඳහන් කරති (විමලකිත්ති හිමි 1957:127). සිරිමල් රණවැල්ල විහාර සළාකය හෙවත් දාන සලාකය කැප්පවීම මින් අදහස් කරන බව සඳහන් කරයි (රණවැල්ල 2011:250). කොටනෙළුවේ චන්ද්‍රජෝති ස්වාමීන්වහන්සේ විහාරගෙය (කුටි) සෑදවීය යන්න මින් අර්ථවත්වන බව පවසති (චන්ද්‍රජෝති හිමි 1962: 63). ඇස්. බී. හෙට්ටිආරච්චි විහාරගෙය (කුටි) සෑදවීය යන අදහස මින් ගම්‍යවන බව කියයි (හෙට්ටිආරච්චි 1979:6). සද්ධාමංගල කරුණාරත්න ද මීට සමාන අදහසක් දරනු ලබයි. විහාරයනට අදාල ගොඩනැගිලි තැනවීම ඒ අනුව අදහස්කර ඇත. (Karunaratna 1984:117). බෙනිල් ප්‍රියංක ද මින් විහාර කුටි හෝ ගොඩනැගිලි සෑදවීම අදහස් කරන බව පෙන්වා දී ඇත. (ප්‍රියංක 2012:11-35). මාලනී ඩයස් අනිවාර්ය සේවයෙන් නිදහස් වීම හෝ පවත්වාගෙන යාම අදහස් කරන බව පවසයි (ඩයස් 1992:1-9). මෙම **විදි වහරල** යන යෙදුමෙන් අනිවාර්ය සේවයෙන් නිදහස්වීම යන්නට අපට ද වඩා එකඟ විය හැකි ය.

**අතරගල විහර** : මෙම ස්ථාන නාමය සඳහන්ව ඇත්තේ අංක 2 ලිපියෙහි ය. මෙයින් කියැවෙන අතරගල විහාරය මෙම ශිලාලේඛනය හමු වූ නටබුන් විහාරය බවට කිසිදු සැයක් නොමැත. මෙම විහාරය හඳුන්වන පැරණි නාමය මෙ තෙක් අනාවරණය වී නොතිබුනු අතර මෙම ශිලාලේඛනය හමුවීමත් සමග එය නිශ්චය කරගැනීමට ලැබීම භාග්‍යයකි. **අතරගල** යන ග්‍රාම නාමය අපට පුද්ගල නාම සමග අවස්ථා කීපයක දී යොදා තිබෙන බවට සාධක හමු වේ. එ නම් **දෙවන සේන** (853-887) රාජ්‍ය සමයට අයත් **තාමරවැව** ලිපියෙහි **අතරගලු නාතා** නමැත්තෙකු ගැන සඳහන් ය (Ranawella 2001:84). මේ හැර **සිව් වැනි කාශ්‍යප** (898-914) රාජ්‍ය සමයට අයත් **මොරගොඩ** ටැම් ලිපියෙහි හා **හම්මිල්ලවැටිය** ටැම් ලිපියේ **අතරගලු කොත්තා** නමැත්තෙක ගැන සඳහන් ය. (ibid:268,271) **පස් වැනි කාශ්‍යප** (914-923) රජුගේ **ගල්නෑව** ටැම් ලිපියෙහි ද මෙම ග්‍රාම නාමය සඳහන්ය (ibid: 297). ලංකාවේ බොහෝ ඓතිහාසික ස්ථාන පිළිබඳ පර්යේෂණය කළ **සී.ඩබ්ලිව්. නිකලස්** මහතා සඳහන් කරන පරිදි සෙල්ලිපි පිහිටුවීමට පැමිණි රාජකීය නිලධාරීනගේ ගම්වල නම් ඇතත් ඇතැම් ඒවා හඳුනාගත නොහැකි බව ද **අතරගල** එ බිඳු ස්ථාන නාමයක් ලෙස ඔහු විසින් දක්වා ඇත (නිකලස් 1979:232). ඒ අනුව දැනටත් අතරගල යනුවෙන් හඳුන්වන ලබන මෙම ප්‍රදේශය නිශ්චිත වශයෙන් ම හඳුනා ගැනීමටත් එය අනුරාධපුර යුගයේ සිට භාවිත වූවක් බව මෙම සෙල්ලිපියට අනුව නිශ්චය කිරීමට හැකියාව ලැබීම විශේෂ කරුණක් වන්නේ ය.

**වඩු මිහිදල** : අංක 2 ලිපියෙහි සඳහන් මොහු **මිහිදල** නම් වඩුවෙකි. මිහිදල යන සංඥා නාමය කුරුණෑගල දිස්ත්‍රික්කයේ **මැදගමින්** හමු වූ සෙල්ලිපියක ද වේ, මෙය වහරල ලිපියක් වීම ද විශේෂත්වයකි. (Paranavitana 1943:144). මීට සමාන මිහිනදල් යන පුද්ගල නාමයක් මිහින්තලයෙන් හමු වේ. මෙම ලිපි දෙකෙහි ම කාලය ක්‍රිස්තු වර්ෂ 7-8 සියවස්වලට අයත් කොට ඇත (ibid:148). වඩුවන් විසින් වහරල

මිදවීම් පිළිබඳ සෙල්ලිපි කීපයකින් ම තොරතුරු අනාවරණය වේ (ibid:139). මේ හැර විවිධ වෘත්තීන්ට අයත් වඩුවන් පිළිබඳ ව සිව් වැනි මිහිඳු රජුට අයත් මිහින්තලා පුවරු ලිපියෙහි සිඳහන් ය. ඇඳුරු වඩුවන්, ලී වඩුවන් උළු වඩුවන් කටු වඩුවන් ආදීන් ගැන එහි තොරතුරු වේ (Wikcramasinghe 1912:97).

**කසුපය :** අංක 3 සෙල්ලිපියෙහි කාශ්‍යප යන මෙම සංඥා නාමය වේ. මෙය අනුරාධපුර යුගයෙහි එ තරම් දුර්ලභ එකක් නොවේ. රූපක ගණනාවකින් මෙය සෙල්ලිපි අතර යෙදී ඇත (රණවැල්ල 2004:64).

**සය ල මලය :** මෙම යෙදුම ශිලා ලේඛනයක දක්නට ලැබෙන පළමු අවස්ථාව මෙය වන්නේ ය. එහෙත් **සයමල** වහරල **අලමල** වහරල යන යෙදුම් හත්ථිකුච්ඡි සෙල්ලිපිවල වේ (හෙට්ටිආරච්චි 1983:36). මෙම යෙදුම්වල අර්ථ අපහැදිළි බව පරණවිතාන සිඳහන් කරයි (Paranavitana 1943:134). එහෙත් අපට යෝජනා කළ හැක්කේ **සය** යන්නෙහි ස්වකීය යන්නත් **ල** යන්නෙහි තරුණ හෝ බාල යන අදහසත් **මලය** යන්නෙහි මල්ලී යන අදහසත් ඇති බවකි.

ආශ්‍රෙය ග්‍රන්ථ


Karunaratna Sddamangala 1984: Epigraphia Zelanica vol. 7 Archaeologicl Survey of Ceylon Published by the Department of Archaeology

චන්ද්‍රජෝති හිමි, කොටනෙලුවේ., 1962: සිංහල සිගරාව.

ඩයස්, මාලනී., 1992: මහාචාර්ය සෙනරත් පරණවිතාන අනුස්මරණ මාසික දේශන මාලාව, දසවැනි දේශන පත්‍රිකාව.( ඔක්තෝබර් 29 ) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, කොළඹ.

නිකලස්, සී. ඩබ්. 1979: පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය, (සිංහල පරිවර්තනය සෝමපාල ජයවර්ධන) තිසර ප්‍රකාශකයෝ, දෙහිවල.

Paranavitana S., 1943: Epigraphia Zelanica vol. iv Archaeologicl Survey of Ceylon Published by the Department of Archaeology.

ප්‍රියංක, බෙනිල්., 2012: වහරල සහ මතෙර මජ්ඣික, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

රණවැල්ල, සිරිමල්., 2011: සිරිමල් රණවැල්ල උපහාර ලිපි සංග්‍රහය, ප්‍රධාන සංස්කාරක සුමනසිරි වාච්චගේ, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

රණවැල්ල, සිරිමල්., 2004: සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

Ranawella S. 2001: Inscriptions of Ceylon, Vol. v-1 Archaeologicl Survey of Ceylon Published by the Department of Archaeology.

රාහුල වල්පොල., 1989: ( 5 වැනි මුද්‍රණය) ලක්දිව බුදු සමයේ ඉතිහාසය, ගුණසේන සහ සමාගම, කොළඹ.

Wijayarathna, D. J. 1952: University of Ceylon Review, Vol. x.

විමලකිත්ති හිමි, මැදඋයන්ගොඩ., 1957: ශිලාලේඛන සංග්‍රහය, 1 කාණ්ඩය, දොඩන්ගොඩ සහ සමාගම, මොරටුව.

හෙට්ටිආරච්චි, එස්. බී., 1979: ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය භාෂා සංස්කෘතික අධ්‍යයනාංශය ජූලි 3 සම්මන්ත්‍රණය.

හෙට්ටිආරච්චි, ඒ. එස්. 1983: ශිලාලිපි සංග්‍රහය, දෙවන කලාපය, පුාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.